**කාලගුණවිද්‍යා දෙපාර්තමේන්තුව**
**வளிமண்டலவியல் திணைக்களம்**
**Department of Meteorology**

දුරකථන : 011 2686686
ෆැක්ස් : 011 2691443
විද්‍යුත් තැපැල : metnmc@gmail.com
වෙබ් අඩවිය : www.meteo.gov.lk

නිවේදන අංකය : **01** WW/O/18/05/21/01
වර්ණය : ඇම්බර්

# තද වැසි, තද සුළං සහ රළු මුහුදු ප්‍රදේශ පිළිබඳව අවවාදාත්මක නිවේදනය

**කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ, ස්වභාවික විපත් පිළිබඳ පූර්ව අනතුරු ඇඟවීමේ මධ්‍යස්ථානය විසින්**
2018 මැයි මස 22 වන දින. පෙ.ව 09.30 වන තෙක් වලංගු වන පරිදි
2018 මැයි මස 21 වන දින. පෙ.ව 09.30 ට නිකුත් කරන ලදී.

## දිවයිනට බස්නාහිරසහ දකුණු දෙසින් වෙරළට ඔබ්බෙන් වන මුහුදු ප්‍රදේශ සඳහා

**සැලකිලිමත් වන්න!**

දිවයිනට බස්නාහිර සහ දකුණු දෙසින් පවතින ක්‍රියාකාරී වලාකුළු පද්ධතින් හේතුවෙන්, මන්නාරම සිට පුත්තලම, කොළඹ සහ හම්බන්තොට හරහා පොත්තුවිල් දක්වා වෙරළට ඔබ්බෙන් වන මුහුදු ප්‍රදේශවල වැසි හෝ ගිගුරුම් සහිත වැසි ඇතිවේ.

**සුළං වේගය ක්ෂණිකව (පැ.කි.මී. 70-80 පමණ) ඉහළ යාමට ඉඩ ඇති හෙයින් එම මුහුදු ප්‍රදේශ ක්ෂණිකව රළු වීමට වැඩි හැකියාවක් පවතී.**

පුත්තලම සිට මන්නාරම හරහා කන්කසන්තුරේ දක්වා සහ ගාල්ල සිට හම්බන්තොට හරහා පොතුවිල් දක්වා වන මුහුදු ප්‍රදේශවල සුළගේ වේගය විටින් විට පැ.කි.මී. 60 දක්වා වැඩි විය හැකි අතර එවිට එම මුහුදු ප්‍රදේශ රළු වේ.

**ධීවර සහ නාවුක ප්‍රජාව මේ පිළිබඳව ඉතා අවධානයෙන් කටයුතු කරන ලෙස ඉල්ලා සිටිනු ලැබේ.**

### අද පෙ.ව 06.00 වනවිට තත්ත්වය

දිවයිනට බස්නාහිර සහ දකුණු දෙසින් වන මුහුදු ප්‍රදේශවල ක්‍රියාකාරී වලාකුළු පද්ධති වර්ධනය වී ඇත

### අනාවැකිය

මෙම ක්‍රියාකාරී වලාකුළු පද්ධති ඉදිරි පැය කිහිපය තුළදී ද සක්‍රියව පවතිනු ඇතැයි බලාපොරොත්තු වේ.

EMERGENCY OPERATIONS DIVISION
RECEIVED
Date : 2018-05-21
Time : 0953
Lakmal
D (Ops)/DG/ADO
DISASTER MANAGEMENT CENTRE

වර්ෂාපතනය(මි.මී) : තරමක් තද වැසි: 50 -100, තද වැසි: 100 – 150, ඉතා තද වැසි: 150 හෝ ඊට වැඩි